**ශීර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයෙහි අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 2015 ඔක්තෝබර් 08 |
| 304 | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 2015 ඔක්තෝබර් 08 |

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,546.38 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,310.03 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.මිලියන 225.27 ක් හා රු.මිලියන 11.08 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.30 ක හා සියයට 3.81 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 106 | 4,255.85 | 4,030.58 | 225.27 | 5.29 |
| 304 | 290.53 | 279.45 | 11.08 | 3.81 |
| **එකතුව** | **4,546.38** | **4,310.03** | **236.35** | **5.20** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**2.2.2 පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 10601 | 7.0 | 6.8 | 2.5 | 3.7 | 16.0 | 12.9 |
| 30401 | 10.0 | 7.0 | 5.5 | 7.9 | 60.0 | 30.5 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 10.90 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 6000/0000/00/0015/0020/000 | 1.65 |
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0159/000 | 9.25 |
| **එකතුව** | | **10.90** |

**2.4 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ

විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ හා 4 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ලේඛනයක් පවත්වා නොතිබුණි |
| (ආ) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එම්.83 දරන පෝර්මය | ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය | ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | ලේඛනයක් පවත්වා නොතිබුණි |
| (ඊ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 හි විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එන් 20 ආකෘතිය | ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (උ) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන | පවත්වා නොතිබුණි |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රකාරව පොදු 267 අකෘතිය | |
| (ඍ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | ලේඛනය පවත්වා නොතිබුණි |
| (එ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(අ) මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඒ) | කමිටු රැස්වීම් වාර්තා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි |
| (ඔ) | වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1647(ඇ) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඕ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

## 3.2 විසර්ජන ගිණුම

### 3.2.1 අයවැය විචලනය

වැය විෂයයන් 8 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.මිලියන 558.94 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 517.41 ක උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශය වෙත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම නිකුත් කර නොතිබීම නිසා එම වැය විෂයයන්ගෙන් රු.මිලියන 41.53 ක් හෙවත් සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති

වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**3.4 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය අනුව වැටුප් ණය ගෙවීම සම්බන්ධයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී අයනොවූ සේවක ණය ශේෂයන්, පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය දෙන බවට 23 වන පරිශිෂ්ඨයේ දැක්වෙන ආකෘතිපත්‍රය අනුව පොරොන්දු පත්‍ර ණයලාභී නිලධාරීන්ගෙන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 කාර්යසාධනය**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) අමාත්‍යාංශය විසින් ආපදාවලට ඔරොත්තු දෙන ආකාරයේ නිවාස 139 ක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 24 කට රු.60,146,608 ක් ප්‍රතිපාදන ලබාදී තිබුණි. 2015 නොවැම්බර් 20 දින වන විට දිස්ත්‍රික්ක 09 ක නිවාස 54 ක් හා දිස්ත්‍රික්ක 03 ක නිවාස 14 ක වැඩ අවසන් කර තිබුණි. ඒ අනුව නිවාස 68 ක වැඩ සම්පූර්ණයෙන් අවසන් කර තිබුණු අතර ඉතිරි නිවාස 71 හි වැඩ අවසන් කර නොතිබුණි.

(ii) ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් හම්බන්තොට කළුතර සහ මොණරාගල යන දිස්ත්‍රික්ක 03 ක් සඳහා ජල ටැංකි මිලදී ගැනීමට පිළිවෙලින් රු.2,000,000 ක්ද, රු.1,000,000 ක් සහ රු.1,000,000 ක් වශයෙන් රු.4,000,000 ක් අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදී තිබුණි. කෙසේ වුවද, මිලදී ගත යුතු ටැංකි ප්‍රමාණය දක්වා නොතිබුණු අතර මොණරාගල දිස්ත්‍රික්කය පමණක් රු.299,000 වැය කර ලීටර 1,000 ක ජල ටැංකි 26 ක් ද, කළුතර දිස්ත්‍රික්කයට රු.2,224,4690 වැය කර ජල ටැංකි 181 ක් හා

හම්බන්තොට දිස්ත්‍රික්කයට රු.495,000 ක් වැය කර ජල ටැංකි 49 ක් මිලදී ගෙන තිබුණි. ඒ අනුව එකතුව රු.3,018,490 ක් වටිනා ජල ටැංකි මිලදි ගෙන තිබුණි. ඉතිරි රු.981,510 සම්බන්ධව විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 18 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 441 | 401 | 40 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 47 | 33 | 14 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 02 | - | 02 |
| | එකතුව | 517 | 454 | 63 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ සහාකාර අධ්‍යක්ෂ, පරිපාලන නිලධාරි හා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන යන තනතුරු 63 ක් පුරප්පාඩු පැවතුණි.

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

අමාත්‍යාංශය විසින් වෙනත් පාර්ශවයන්ගෙන් පහත සඳහන් පරිදි මානව සම්පත් ලබා ගෙන තිබුණි.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| කළමනාකරණ සහකාර | 01 | බස්නාහිර පළාත් විදුලි බල හා බලශක්ති ජාතික අමාත්‍යාංශය | 2011.01.09 සිට 2015.01.09 දක්වා |

| | | | |
|---|---|---|---|
| පෞද්ගලික සහකාර | 01 | භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 2011.01.01සිට 2015.01.09 දක්වා |
| රියදුරු | 01 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 2013. 06. 09 සිට 2015.01.09 දක්වා |

## 4 ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### 4.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ආ) | රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ඉ) | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත | මුදල් රෙගුලාසි 1647(ඇ) | පවත්වා නොතිබුණි. |
| (ඊ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |

**4.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලන**

304-2-1-2104-11 වැය විෂය සඳහා රු.17,095,479 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පරිදි අග්‍රිම ලබා නොදීම නිසා එම මුළු ප්‍රතිපාදනයෙන් රු.10,001,486 ක් හෙවත් සියයට 58.5 ක ප්‍රතිපාදන උපයෝජනය කිරිමට නොහැකි වි තිබුණි.

**4.3 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.3,196,562 ක්වූ තැන්පතු 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 304 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.172,479 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 05 සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

**4.5 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) ජංගම නොවන වත්කම්**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු පරිශ්‍රයේ තණකොළ ඇල්ලීම සඳහා රු.1,143,790 ක් වියදම් කර ඇති අතර එම වටිනාකම පරිශ්‍ර නඩත්තු කිරීමේ වියදමක් විය යුතු වුවත්, ස්ථාවර වත්කම් ලේඛනයේ ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම යටතේ ඇතුළත් කර තිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩමට අයත් පර්චස් 99.4 ක් වූ ඉඩම 2008 වර්ෂයේදී ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ලබා දී තිබුණු අතර එහි සම්පූර්ණ අයිතිය 2014 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය වෙත පවරා දී නොතිබුණි.

## 4.6 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂය සඳහා වූ දෙපාර්තමේන්තුවේ පාඩු හා අයකර ගැනීම් ප්‍රකාශනයට අනුව වසර 05 ට වැඩි කාලයක් අයකරගත යුතු රු.126,580 ක් තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත් හැරීමට නොහැකිව පැවතුණි.

## 4.7 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණය පහත දැක්වේ.

**ඩොප්ලර් රේඩාර් පද්ධතිය**

ඩොප්ලර් රේඩාර් පද්ධතිය මිලදී ගැනීම සඳහා 2007 සහ 2008 වර්ෂයන්හිදී රු.320,000,000 ක් ලෝක කාලගුණ මධ්‍යස්ථානය වෙත ගෙවා තිබුණි. එය ස්ථාපනය කිරීමට ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ රු.60,452,000 ක් පිරිවැය ඇස්තමේන්තුවක් මත කොන්ත්‍රාත්තුවකට එළඹ තිබුණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට එකතු කළ අගය මත බදු සහිතව රු.50,131,059 ක් එම කාර්යාංශය වෙත ගෙවා තිබුණි. එම යන්ත්‍රය 2013 ඔක්තෝබර් මාසය වන විට සවිකර අවසන් කර තිබුණි. කෙසේවුවද, 2015 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම යන්ත්‍රය ක්‍රියාත්මක නොවීම නිසා එම යන්ත්‍රය සවිකර වර්ෂ 01 මාස 11 ක කාලයක් අක්‍රීය තත්ත්වයේ පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය

## 4.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 54 | 39 | 15 |
| (ii) තෘතියික මට්ටම | 29 | 04 | 25 |
| (iii) ද්විතියික මට්ටම | 238 | 170 | 68 |
| (iv) ප්‍රාථමික මට්ටම | 139 | 118 | 21 |
| (v) වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 10 | - |
| **එකතුව** | **460** | **331** | **129** |